**2017 නොවැම්බර් 15 වැනි දින, විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 28 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව සමාලෝචනයට බඳුන් කෙරෙයි**

විශ්ව කාලාන්තර සමාලෝචනය යටතේ පිළියෙළ කරන ලද ශ්‍රී ලංකාවේ වාර්තාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව කාලාන්තර සමාලෝචන ක්‍රියාකාරී කණ්ඩායමේ සලකා බැලීම සඳහා 2017 නොවැම්බර් 15 වැනි දින ජිනීවා නුවරදී ඉදිරිපත් කිරීමට නියමිතය.

එක්සත් ජාතීන්ගේ සෑම සාමාජික රාජ්‍යයකම මානව හිමිකම් වාර්තාව සෙසු සාමාජික රාජ්‍ය විසින් සමාලෝචනය කරනු ලබන ක්‍රියාපරිපාටියක් ලෙස, විශ්ව කාලාන්තර සමාලෝචනය, 2006 වසරේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලදී.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය හරහා සිදු කරනු ලබන මෙම සමාලෝචනය, සෑම රටක්ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව දරන මානව හිමිකම් පිළිබඳ වගකීම් හා බැඳීම්, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, එම රට පාර්ශ්වකරුවකු වන මානව හිමිකම් ගිවිසුම්, සහ අනෙකුත් මූලාශ්‍ර මත පදනම් වෙයි. මෙම ක්‍රියාපරිපාටියේදී, සමාලෝචනයට බඳුන් වන රට සිය මානව හිමිකම් තත්ත්වය පිළිබඳව ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කොට, මානව හිමිකම් කවුන්සිලය ඉදිරිපිට පෙනී සිටියි. එහිදී, එම රටේ මානව හිමිකම් තත්ත්වය සම්බන්ධයෙන් වන සිය නිර්දේශ එක්සත් ජාතීන්ගේ සෙසු සාමාජික රටවල් විසින් එම රටට ඉදිරිපත් කරනු ලබයි. මෙම නිර්දේශ එක්කෝ 'පිළිගැනීමට' නැත්නම් 'සටහන් කරගැනීමට' සමාලෝචනයට භාජනය වන රාජ්‍යයට හැකියාව තිබේ. එසේ පිළිගන්නා නිර්දේශ අනාගතයේදී එම රට විසින් කළ යුතු වාර්තාවල පදනම බවට පත්වෙයි.

තම මානව හිමිකම් තත්ත්වය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවල් පරීක්ෂාවට සහ සමාලෝචනයට බඳුන් වන එකම ක්‍රියාපරිපාටිය වනුයේ විශ්ව කාලාන්තර සමාලෝචනයයි. ශ්‍රී ලංකාව සිය පළමු විශ්ව කාලාන්තර සමාලෝචන චක්‍රයට 2008 දීත්, දෙවැනි චක්‍රයට 2012 දීත් භාජනය විය. නොවැම්බර් මස 15 වැනි දින පැවැත්වෙන සමාලෝචනය, ශ්‍රී ලංකාවේ තුන්වැනි විශ්ව කාලාන්තර සමාලෝචනය වන අතර, නොවැම්බර් මස 6 සිට 17 වැනිදා දක්වා පැවැත්වෙන ක්‍රියාකාරී කණ්ඩායමේ 28 වැනි සැසිවාරයේදී, විශ්ව කාලාන්තර සමාලෝචනයේ තුන්වැනි චක්‍රය යටතේ ශ්‍රී ලංකාව සමඟ ආර්ජෙන්ටිනාව, බෙනින්, චෙක් රාජ්‍යය, ගැබොන්, ඝානාව, ගුවාතමාලාව, ජපානය, පාකිස්තානය, පේරු, කොරියානු ජනරජය, ස්විට්සර්ලන්තය, යුක්රේනය සහ සැම්බියාව යන රටවල්ද සමාලෝචනයට බඳුන් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාවට පහත දැක්වෙන සබැඳියෙන් අන්තර්ජාලය ඔස්සේ පිවිසිය හැකිය:

https://documents-dds-ny.un.org/doc/UNDOC/GEN/G17/247/34/PDF/G1724734.pdf?OpenElement

එමෙන්ම webtv.un.org යන අන්තර්ජාල ලිපිනය ඔස්සේ සමාලෝචනය සජීවීව නැරඹීමේ හැකියාව ඇත.

ජාතික ප්‍රතිපත්තිය ලෙස ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගේ මානව හිමිකම් සුරැකීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඉහළට ඔසවා තැබීමටත් ජාතික සම්මුතිවාදී රජයේ ඇති දෘඪ කැපවීම අනුව යමින්, විශ්ව සමාලෝචනය පිණිස සහභාගී වන ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නායකත්වය ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා විසින් දරනු ලබයි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, ජනාධිපති කාර්යාලයේ සහ ජිනීවා නුවර එක්සත් ජාතීන් සඳහා වූ නිත්‍ය නියෝජිත කාර්යාලයේ නිලධාරිහු නියෝජිත පිරිසට ඇතුළත් වෙති.

2012 පැවැත්වූ දෙවැනි විශ්ව කාලාන්තර සමාලෝචනයේදී ශ්‍රී ලංකාව විසින් පිළිගනු ලැබූ නිර්දේශවල කොටසක් වූ ක්ෂේත්‍ර ශ්‍රී ලංකා ජාතික වාර්තාවෙන් ආවරණය වෙයි. කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය සහ කල්මුනේ ප්‍රදේශවලදී කරන ලද මහජන ප්‍රව්චාරණද, අන්තර්ජාලය ඔස්සේ සහ තැපැල් මාර්ගිකව කරනු ලැබූ ප්‍රව්චාරණද ඇතුළත්ව සියලුම කොටස්කරුවන් සමඟ පුළුල් ලෙස කරනු ලැබූ ප්‍රව්චාරණවලින් අනතුරුව ජාතික වාර්තාව කෙටුම්පත් කරනු ලැබිණි.

දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ සුරැකීම සඳහා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමඟත්, එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රාජ්‍ය සමඟත් වැඩදායක ආකාරයෙන් අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2017 නොවැම්බර් 13